# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1996 අංක 20 දරන
# ඉඩම් සංවර්ධන
# (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1996 අගෝස්තු මස 14 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1996 අගෝස්තු මස 16 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබා ගත හැක.

මිල : ශත 45 යි. තැපැල් ගාස්තුව : රු. 2.00 යි

# 1996 අංක 20 දරන ඉඩම් සංවර්ධන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1996 අගෝස්තු මස 14 වන දින.]

එල්. ඩී.—ඕ. 60/95

**1988 අංක 30 දරන බැංකු පනත යටතේ ලියාපදිංචි කරන ලද පෞද්ගලික වාණිජ බැංකු සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකු සඳහා විධි විධාන සැලැස්වීම පිණිස ද, ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ නිකුත් කරන ලද ප්‍රදානයන් උකස් සම්බන්ධයෙන් ඇප වගයෙන් භාර ගැනීම පිණිස ද, ඉඩම් සංවර්ධන ආඥාපනත සංශෝධනය කිරීම පිණිස සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධි විධාන සැලැස්වීම පිණිස ද, වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**ලුහුඬු නාමය.**

1. මේ පනත 1996 අංක 20 දරන ඉඩම් සංවර්ධන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**464 වන අධිකාරියේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.**

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන ඉඩම් සංවර්ධන ආඥාපනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) "ලංකා බැංකුව" යන්නෙහි අර්ථ කථනය ඉවත් කිරීමෙන්;

(ආ) "ඉඩම් නිලධරයා" යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :-

"බලපත්‍රලත් වාණිජ බැංකුව" යන්නෙන් 1988 අංක 30 දරණ වාණිජ බැංකු පනතේ අර්ථානුකූල බල පත්‍රයක් වාණිජ බැංකුවක් අදහස් වේ ; සහ

(ඇ) "මහජන බැංකුව" යන්නෙහි අර්ථකථනය ඉවත් කිරීමෙන්.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 41 අ වගන්තිය ප්‍රතියෝජනය කිරීම.**

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 41අ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලබේ:—

"බැංකු සහ නියමිත ආයතන මගින් තනාකිරීම සඳහා පිහිටුවීම.

41අ. බලපත්‍රලත් වාණිජ බැංකුවක්, රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකුව, ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව, ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, සීමාසහිත ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව, ලියාපදිංචි කළ සමිතියක් හෝ වෙනත් යම් නියමිත ආයතනයක් නමට ලියා අත්සන් කර ඇති උකසක් ක්‍රියාත්මක කිරීම සඳහා, ප්‍රදානයක් මත අත්සතු කරනු ලැබූ යම් ඉඩමක්, එකී බලපත්‍රලත් වාණිජ බැංකුව, බැංකුව, සංස්ථාව, අධිකාරිය, ලියාපදිංචි කළ සමිතිය හෝ නියමිත ආයතනය පිහිටුවීම සඳහා නීතියේ විධිවිධානවලට අනුකූලව එකී බලපත්‍රලත් වාණිජ බැංකුව, බැංකුව, සංස්ථාව, අධිකාරිය, ලියාපදිංචි කළ සමිතිය හෝ නියමිත ආයතනය විසින් තනතමට

ගෙන විකිණීමට මේ පරිච්ඡේදයේ ඉහත සඳහන් විධිවිධාන කිසිවකින් වැළැක්වෙන්නේ යයි නොසැලකිය යුතු ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තියේ (ආ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(ආ) එසේ දරනු ලබන ඉඩම, බලපත්‍රලත් වාණිජ බැංකුවට, රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකුවට, ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාවට, ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුවට, ජාතික නිවාස සංවර්ධන අධිකාරියට, සීමා සහිත ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට, යම් ලියාපදිංචි කළ සමිතියකට හෝ වෙනත් නියමිත ආයතනයකට හැර අන් කිසි තැනැත්තකු වෙත උකස් නොකළ යුතු ය. ".

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

5. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.